මොරවැව ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 09 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 19 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ස්ථාවර තැන්පතු කල්පිරීමෙන් ලැබුණු මුදල් ස්ථාවර තැන්පතු ගිණුමට බැර කර පොලිය ආදායමට ගැළපීම් කර නොතිබුණි. මේ හේතුවෙන් ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය රු. 195,838 අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සේවක ණය ලේඛනය අනුව 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,178,932 ක් වූ සේවක ණය ශේෂය රු. 973,336 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සේවක ණය රු. 205,596 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) තැන්පතු ලෙජරය අනුව 2015 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු. 1,350,734 ක් වුවත්, රු. 1,272,837 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු රු. 77,897 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය සඳහා ගෙවිය යුතු පොලී මුදල වූ රු. 551,917 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයට අදාලව 2015 වර්ෂය තුලදී ගෙවන ලද ණය පොලී මුදල වූ රු.773,575 සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර ණය ගිණුමට හර කිරීමෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා ඇත.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු. 8,772,379 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 8,105,199 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 667,180 ක් අඩුවෙන් ණය ශේෂය දක්වා ඇත.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම

2011 වර්ෂයේ සිට පැවත එන රු. 7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයන්ට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ලැබිය යුතු ගිණුම් | 950,536 | ශේෂ සනාථ ලිපි, කාල විශ්ලේෂණ වාර්තා |
| ගෙවිය යුතු ගිණුම් | 214,316 | |
| වාහන ආදායම | 123,950 | ආදායම් රැස් කිරීමේ උපලේඛන |

### 1.3.4 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 10 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,612,963 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,255,867 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,868,830 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 148 | 43 | - |
| බලපත්‍ර ගාස්තු | 1,870 | 27 | 334 |
| වෙනත් ආදායම් | 248 | 257 | 45 |

2.2.2 මුද්දර ගාස්තු

නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව විනාශ කලයුතු, අළුත්වැඩියා කලයුතු හා විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධ නිර්දේශයන් 2016 ජුනි 14 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර ලබා දීමේ වැඩ සටහන හා පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාවට ලබා දුන් වාහන 07 කට අදාලව අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2016 අගෝස්තු 03 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ඇ) JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාසික වාරික 60 කින් ගෙවා නිම කිරීමට 2013 මැයි මස ලබාගත් රු. 9,520,000 ක ණය මුදල වෙනුවෙන් 2015 ජුලි 30 දින වන විට ගෙවිය යුතු ණය මුදල හා පොලිය රු. 3,952,391 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ රථවාහන 06 ක් සඳහා සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල JCB යන්ත්‍රයට අදාලව ගිණුම්ගත කල ඉන්ධන ප්‍රමාණය ලීටර 7721 ක් වූ අතර, දෛනික ධාවන සටහන් අනුව පාවිච්චි කල ඉන්ධන ප්‍රමාණය ලීටර 7012 ක් විය. රු. 67,355 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 709 ක වෙනසක් දක්නට ලැබුණි.

(ඊ) 1980 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශ තුල ක්‍රියාත්මක වන වී මෝල්, වඩු කර්මාන්ත සහ ගරාජ 22 ක් සඳහා එම බලපත්‍ර නිකුත් නොකර වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

3.2.1 ඇතාබැඳිවැව ප්‍රධාන මාර්ගය ඉදිකිරීම

-------------------------------------------

මෙම මාර්ගයේ කි.මී. 2 ක් ගල් අතුරා තාර දමා ඉදිකිරීම වෙනුවෙන් 2012 පෙබරවාරි 21 හා 2012 මැයි 31 දිනයන්හි රු. 12,946,956 ක් සහ රු. 18,046,600 ක වටිනාකම්වලට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ගිවිසුම ප්‍රකාරව මෙම මාර්ගය අදියර දෙකකින් නිම කිරීමට කටයුතු කර තිබුණු අතර, ඉදිකිරීම් කාර්යය සාධනය සතුටුදායක මට්ටමක නොතිබීම හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත් දෙකම නවතා වෙනත් කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කොන්ත්‍රාත්කරුවන් ඇගයීම් කර වඩා සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම නිසා රු. 12,317,552 ක් අතිරේකව ගෙවීම් කිරීමටත් නියමිත කාලය තුල ඉදිකිරීම් සම්පූර්ණ කිරීමටත් නොහැකි වී තිබුණි.

(ආ) පළමු කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණද එම කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

(ඇ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 43,311,108 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ධ (CIGFL) වන රු. 108,278 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

**3.2.2** රොටවැව පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

---------------------------------------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රොටවැව පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 303,572 ක මුදලක් 2015 දෙසරම්බර් 23 ගෙවා තිබුණු අතර, එය අළුත්වැඩියා කර 2015 අගෝස්තු 05 දින සභාව වෙත භාර දී තිබූ නමුත් පුස්තකාලයෙහි වැඩ කටයුතු ආරම්භ කිරීමට හා ඒ සඳහා විදුලිය ලබා ගැනීමට 2016 ජූලි 05 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 14 | 06 | 08 |
| තෘතීය මට්ටම | 16 | 14 | 02 |
| එකතුව | 31 | 20 | 11 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 අප්‍රේල් මස සිට වැඩ බැලීමේ පදනම මත ලේකම්වරයකු පත්කර තිබුණු අතර, මේ වන තෙක් ඔහු සභාවේ සේවය කරයි.

(ආ) සේවකයන් 04 දෙනෙකු පමණක් කාර්යාලය තුල ලිපි ලේඛන නඩත්තු කරන බැවින් ලිපිලේඛන විධිමත් ලෙස පවත්වාගෙන ගොස් නොමැති අතර, එය විගණන කටයුතු කර ගෙන යාමේ දී ගැටළුවක්ව පැවතුණි.

4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|
| (අ) ගිණුම්කරණය | **i.** ගිණුම් තැබීම<br>**ii.** උපයෝගී ලෙජර පවත්වා ගෙන යාම |
| (ආ) ආදායම් පරිපාලනය | **i.** හිඟ ආදායම් අයකර ගැනීම<br>**ii.** උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | **i.** ගිවිසුම්ගත කාලය තුල කොන්ත්‍රාත් නිම කිරීමට කටයුතු කිරීම.<br>**ii.** කර්මාන්ත සහතික අරමුදල් බදු ගෙවීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | **i.** සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.<br>**ii.** වැඩ බෙදීම විධිමත් පරිදි සිදු කිරීම. |